# ලංසු සඳහා ආරාධනයයි

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# "ස්වීට් ඉරිඟු" (Sweet Corn) වගාව සඳහා නැප්සැක් බහුකාර්ය යන්ත්‍ර, බීජ සහ ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති සැපයීම සහ ස්ථාපනය කිරීම.

### ලංසු අංකය: SARP/G/NCB/SC-RM/2025/692

1. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදලෙන් (IFAD) ණය මුදලක් ලැබී ඇත. එහි කොටසක් SARP ව්‍යාපෘතිය යටතේ, කුරුණෑගල, සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රතිලාභීන්ට දේශගුණයට ඔරොත්තු දෙන බෝග ව්‍යාපෘතියක් ලෙස "ස්වීට් ඉරිඟු" (Sweetcorn), වගාව සඳහා නැප්සැක් බහුකාර්ය යන්ත්‍ර, Seeder සහ ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති ප්‍රසම්පාදනය කිරිම සඳහා යෙදවීමට අදහස් කරයි.

2. SARP ව්‍යාපෘතිය, දේශගුණයට ඔරොත්තු දෙන බෝග ව්‍යාපෘතියක් ලෙස Farmer First - Sweet Corn සඳහා අවශ්‍ය අයිතම සැපයීම, බෙදා හැරීම සහ ස්ථාපනය කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. කාණ්ඩ අංකය, අයිතම නාමය, අවශ්‍ය ප්‍රමාණයන් සහ අනුරූප ලංසු සුරක්ෂණයේ වටිනාකම ආදී තොරතුරු පහත වගුවේ දැක්වේ.

3.

| කාණ්ඩ අංකය. | අයිතම විස්තරය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|
| A | නැප්සැක් බහුකාර්ය යන්ත්‍ර (Knapsack Multifunctional Machines) | 300 | 300,000.00 |
| B | සීඩර් (Seeder) | 300 | 160,000.00 |
| C | ක්ෂුද්‍ර (තල වර්ගයේ ඉසින) වාරිමාර්ග පද්ධතිය (Micro (Blade type Sprinkler) Irrigation System) | 300 | 900,000.00 |

4. ප්‍රතිචාර දැක්වීමට සහ ලංසු ලේඛනයේ දක්වා ඇති සීමාවන්ට අනුගතවීමට කැමති සියළුම යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් සඳහා මෙම ලංසු ආරාධනාව විවෘත වේ. තවද මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු SARP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. කාර්යාල වේලාව තුළදී, පහත දැක්වෙන ලිපිනයැති ස්ථානයේදී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** කාලයේදී ගාස්තු ගෙවීමකින්තොරව ලංසු ලිපි ලේඛන පරික්ෂා කොට බැලිය හැක.

5. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ ලංසු මෙහෙයවන/කැඳවන අතර www.ifad.org/project-procurement වෙබ් අඩවියෙහි ලබා දී ඇති IFAD ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව මෙම ලංසු ලිපිලේඛනයන්හි ඇගයීමේ පටිපාටිය විස්තරකොට ඇත. NCB ක්‍රියාවලියෙහි විස්තර කොට ඇති පරිදි කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර නිර්දේශයන් පරික්ෂා කර බැලීම, සුදුසුකම් හා පෙර කාර්යසාධන සමාලෝචනය සහ සත්‍යාපනය කිරීම ඇතුළත් වේ.

6. ලංසු ලේඛනයේ III වන කොටසේ, ලංසු දත්ත පත්‍රිකාවේ (BDS) විස්තර කර ඇති පරිදි, ලංසු තැබීමට පෙර **පූර්ව ලංසු රැස්වීමක්/සම්මන්ත්‍රණයක් (Pre bid Meeting) 2025 දෙසැම්බර් මස 08 වන දින පෙ.ව. 10.00** ට පහත සඳහන් ලිපිනයැති ස්ථානයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

7. ලංසු ඉදිරිපත් කිරීමට කැමති ලංසුකරුවන් **2025 දෙසැම්බර් මස 18 දින හෝ ඊට පෙර රු. 12,500/= ක** ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලංසු ලේඛනය මිලදී ගත යුතුය.

8. පහත දැක්වෙන ලිපිනයට, ලංසුකරුගේ සම්පූර්ණ තොරතුරු සහිතව විද්‍යුත් ලිපියක් හෝ ලිපියක් එවීමෙන්ද ලංසු ලිපි ලේඛන ලබා ගත හැක. ලංසු ලේඛන ලබා ගැනීම සඳහා මුදල්ගෙවීම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) අයත්වන **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040662, වෙත කෙරෙන බැංකු ගණුදෙනුවක් මගින් සිදු කළ හැකි අතර SARP ව්‍යාපෘතිය වෙත පැමිණීමෙන්ද එහි ගණකාධිකාරී අංශය වෙත මුදල් ගෙවිය හැකියාව ඇත.**

9. ලංසු දත්ත පත්‍රිකාවෙහි , ලංසුකරුවන්ට උපදෙස් 23.1 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එහි සඳහන් කර ඇති ලිපිනයට **2025 දෙසැම්බර් මස 19 දින ප.ව. 11.00 ට පෙර ලංසු ගෙනවිත් භාරදිය යුතු අතර ප.ව.11.00 ට ලංසු විවෘත කරනු ලැබේ**. ඉලෙක්ට්‍රෝනික් ලංසු පිළිනොගන්නා බව කාරුණාවෙන් සැළකිය යුතුය

10. කිසිදු තත්වයක් යටතේ ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා බවත්, එවැනි ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු හරවා එවන බවත්, ඒවායෙහි පිරිවැය ලංසුකරු විසින්ම දැරිය යුතු බවත් සියළුම ලංසුකරුවන් දැනගත යුතුය. තවද සියළුම ලංසු සමග ඉහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

11. ලිපිනය

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

**නො: 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන: 011 2770998 විද්‍යුත් තැපැල: Procurementsarp@gmail.com**